# කාන්තා පරිගණක අධ්‍යාපනය සහ භාවිතය

එච්. ඩී. පී. මධුෂානි[1] ඩබ්. වී. පී. එම්. නයෝමි[2]
ඩී. එම්. එච්. දසනායක[3] එල්. ජී. ඩී. පෙරේරා[4]

**සංක්ෂේපය**

පරිගණක තාක්ෂණය සැමදා විවිධ අංශයන්ගෙන් ලෝකයේ ජීවන රටාව වැඩි දියුණු කිරීමෙහිලා පිටුවහලක් වේ. කුඩා දරුවාගේ පටන් ජංගම දුරකථනයකින් හෝ විද්‍යුත් මාධ්‍ය ඔස්සේ එකිනෙකා හමුවන මෙම යුගයේ කාන්තාවන් කෙතරම් දුරට පරිගණක හා තොරතුරු තාක්ෂණය සමඟ සබැදි විය යුතු ද යන්න විමසිය යුත්තකි. කාන්තාවන් පරිගණක අධ්‍යාපනයෙහි නියුතු ප්‍රවණතාවය අඩු වීමට හේතුව කුමක්ද යන්න මෙහි අධ්‍යයන ගැටළුව වේ. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ කාන්තාවන් පරිගණක අධ්‍යාපනයෙහි නියුතු ප්‍රවණතාවය වැඩි කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග හඳුනාගැනීමයි. අධ්‍යයනය සඳහා ද්විතියික දත්ත භාවිතා කළ අතර ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් දත්ත ලබාගන්නා ලදි. දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රතිශතක අගයන් භාවිත කළ අතර එහිදී අනාවරණය වූ කරුණු අතර අධ්‍යාපනය, කාන්තා සහ පුරුෂ ඉදිරි දර්ශනය පිළිබඳ විෂමතාව, පරිගණක ක්ෂේත්‍රය තුළින් කාන්තාවකගේ වෘත්තිය ඉදිරි ගමනට, දියුණුවට ඇති බාධක සහ පවුල් පසුබිම වැනි කරුණු පරිගණක සාක්ෂරතාව අඩු වීමට හේතු වී තිබේ. රටක ආර්ථිකය පිළිබඳව සැලකීමේදී තොරතුරු තාක්ෂණය සඳහා, ස්ත්‍රීන්ටද වැදගත් භූමිකාවක් ඉටු කළ හැකිය. පරිගණක තාක්ෂණය පිරිපුන් කාන්තා සංකලනයක් සහිත ශ්‍රමික පිරිසක් යෙදවීම මිනිස් ආර්ථික කාර්යක්ෂමතාවය ඉහල දැමිය හැකි වේ. කාන්තාවන් පරිගණක හා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ඉදිරියට ගෙන ඒමට කටයුතු කළහැකි නම්, කාන්තා ශ්‍රම බලකාය දේශීය ආර්ථිකයට මහඟු අත්වැලක් වන බවත් දරුවන්ගේ අධ්‍යාපනය සඳහා ද එය මනා පිටිවහලක් වන බවත් අධ්‍යයනය මගින් අනාවරණය විය.

**මුඛ්‍ය පද :** *පරිගණක සාක්ෂරතාව, ආර්ථික කාර්යක්ෂමතාවය, කාන්තා භූමිකාව*

---

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය,
pavithrahdm@gmail.com
[2]ශාස්ත්‍රවේදී(විශේෂ) සමාජ සංඛ්‍යානය,කැලණිය විශ්වවිද්‍යාලය,
wickramasinghe.mahesha@yahoo.com
[3]ශාස්ත්‍රවේදී(විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය,
harshanidasanayake1991@gmail.com
[4] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය,
gdinusha.perera@gmail.com